## අවසාන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - www.eduLanka.LK

### සංගීතය 1

වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. "ස රි ග ම ප ධ නි"
   භූපාලි රාගයේ ආරෝහණ වීමට ඉහත සඳහන් ස්වර සකස් විය යුත්තේ කෙසේද?
   1) ම නි ඉවත් කළ යුතුය.
   2) රි ධ ඉවත් කළ යුතුය.
   3) ග නි ඉවත් කළ යුතුය.
   4) ම ප ඉවත් කළ යුතුය.
2. ග ප ධ නි / ස - ධප / මග මරි / සරිස - / මෙම ස්වර ඛණ්ඩය
   1) භූපාලි රාගයට අයත්ය.
   2) බිලාවල් රාගයට අයත්ය.
   3) භීමපලාසි රාගයට අයත්ය.
   4) ඛමාජ් රාගයට අයත්ය.
3. එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් නිර්මාණය කළ නාට්‍ය වනුයේ
   1) හුණුවටය කථාව
   2) මනමේ
   3) තාරාවෝ ඉගිලෙති
   4) රතු හැට්ටකාරි
4. වංග සංගීත ආභාෂය ලබමින් මෙරට ගීත සාහිත්‍යයක් ආරම්භ කිරීමේ පුරෝගාමියා වූයේ
   1) අල්හාජ් මොහිදීන් බෙග්
   2) ආනන්ද සමරකෝන්
   3) සුනිල් ශාන්ත
   4) එඩ්වඩ් ජයකොඩි
5. සන්තූරය
   1) තත් වාද්‍ය භාණ්ඩයකි.
   2) ඝන වාද්‍ය භාණ්ඩයකි.
   3) අවනද්ධ වාද්‍ය භාණ්ඩයකි.
   4) ස්වර පුවරු භාණ්ඩයකි.
6. මෙම ස්වර ඛණ්ඩයේ නිවැරදි ස්වර ලකුණු යොදා සකස් කිරීමේදී සළකුණු යෙදිය යුතු නිවැරදි ආකාරය වන්නේ.
   1) <u>නි</u> ධ - ප / ම ප <u>ග</u> ම / ප _ _ _ / ප ම <u>ග</u> රි
   2) නි <u>ධ</u> - ප / ම ප ග ම / ප _ _ _ / ප ම ග රි
   3) නි ධ - ප / ම' ප ග ම'/ ප _ _ _ / ප ම' ග රි
   4) <u>නි</u> ධ - ප / ම' ප <u>ග</u> ම' / ප _ _ _ / ප ම' <u>ග</u> <u>රි</u>
7. මෙම ස්වර ඛණ්ඩය අයත් රාගය වන්නේ
   1) බිලාවල් 2) භූපාලි 3) භෛරවි 4) යමන්
8. මෙම ස්වර ඛණ්ඩය එක්තරා රාගයක
   1) ස්වර අභ්‍යාසයකි.
   2) සර්ගම් ගී ඛණ්ඩයකි.
   3) මධ්‍ය ලය ගී ස්වර පදයකි.
   4) ආරෝහණ අවරෝහණයකි.
9. එම රාගය ආශ්‍රිතව යැපෙන සරල ගීතයකි.
   1) අඳුර අඳුර මගේ
   2) රැක් අත්තන මල මුදුනේ
   3) දන්නෝ බුදුන්ගේ
   4) සැඳෑ කළුවර
10. කෝඩ්ස් වාදනය කළ හැකි භාණ්ඩයකි.
    1) සිතාරය 2) වයලීනය 3) ගිටාරය 4) එස්රාජය
11. මන්ද්‍ර මධ්‍ය උච්ච සප්තක තුනේම ස්වර ගණන
    1) 21කි. 2) 24කි. 3) 8කි. 4) 15කි.

www.eduLanka.LK



ඉස්කෝලේ edulanka.lk

12. ගුත්තිල කාව්‍යයේ එන ගීත
    1) නාඩගම් ගීත වේ.
    2) නාට්‍ය ගීත වේ.
    3) සේගී වේ.
    4) ගැමි ගී වේ.

13. මැන්ඩලීනයේ තත් සුසර කළ යුත්තේ
    1) සිතාරයේ තත් සුසර කරන ආකාරයටය.
    2) ගිටාරයේ තත් සුසර කරන ආකාරයටය.
    3) තාම්පුරාවේ තත් සුසර කරන ආකාරයටය.
    4) වයලීනයේ තත් සුසර කරන ආකාරයටය.

14. මාත්‍රා 3, 4 යන වටිනාකම් දැක්විය හැකි බටහිර සංගීත ප්‍රස්ථාර කරණයේදී හඳුන්වනු ලබන සංකේත නාමයන් වන්නේ.
    1) Dotted minim – Semibreve
    2) Crochet – Semibreve
    3) Dotted minim – crochet
    4) Semibreve - minim

අංක 15 සිට 18 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු පහත දැක්වෙන ස්වර පුවරුව උපයෝගී කරගනිමින් සපයන්න.




15. C minor chode එකට අයත් ස්වර වලට හිමි ස්වර පුවරුවේ අංක වනුයේ
    1) 1, 5, 6
    2) 1, 4, 8
    3) 1, 3, 5
    4) 1, 2, 5

16. ඉහත ස්වර පුවරුවේ රි ග ධ නි යන ස්වර වලට හිමි අංක වනුයේ
    1) 2, 4, 9, 11
    2) 2, 4, 9, 10
    3) 2, 4, 7, 9
    4) 2, 4, 7, 11

17. F minor chord එකට අයත් ස්වර දක්වනු ලබන අංක වනුයේ
    1) 6, 11, 12
    2) 7, 11, 13
    3) 6, 7, 16
    4) 6, 10, 13

18. සරල පදමාලා හා මුඛ පරම්පරාවෙන් පැවත එන්නේ
    1) සේ ගී
    2) සරල ගී
    3) ගැමි ගී
    4) නාට්‍ය ගී

19. සිංහල චිත්‍රපට සංගීතය සඳහා මුල් යුගයේ බෙහෙවින් ඉවහල් වී ඇති සංගීත සම්ප්‍රදාය වන්නේ
    1) හින්දුස්ථානය
    2) දකුණු ඉන්දියානු
    3) වංග
    4) බටහිර

අංක 20 සිට 22 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු පහත දැක්වෙන වගුව ඇසුරින් සපයන්න.

| | සංගීත භාණ්ඩයේ නම | | යොදාගන්නා ගීත වර්ගය |
|---|---|---|---|
| a | බුම්මැඩිය | අ | සොකරි ගී |

| | | | |
|---|---|---|---|
| b | තබ්ලාව | ආ | නෙළුම් ගී |
| c | දවුල | ඉ | නාඩගම් ගී |
| d | මද්දලය | උ | නූර්ති ගී |

20. a හි සඳහන් සංගීත වාද්‍ය භාණ්ඩය උපයෝගී කර ගන්නා ගී වර්ගය ඇත්තේ
    1) අ 2) ආ 3) ඉ 4) උ
21. b හි d හි සඳහන් වාද්‍ය භාණ්ඩ යොදාගන්නා ගීත වර්ග ඇත්තේ
    1) "ඉ" සහ "උ" වලය. 3) "උ" සහ "ඉ" වලය.
    2) "අ" සහ "ඉ" වලය. 4) "ආ" සහ "උ" වලය.
22. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ඇත්තේ
    1) a වලය. 2) b වලය. 3) c වලය. 4) d වලය.
23. "ස රි ග ම ප" යන ස්වර ඛණ්ඩය තුළ
    1) චල ස්වර 2 කි. අචල ස්වර 3 කි. 3) චල ස්වර 3 කි. අචල ස්වර 2 කි.
    2) චල ස්වර 1 කි. අචල ස්වර 4 කි. 4) චල ස්වර 4 කි. අචල ස්වර 1 කි.
24. හින්දි තනු අනුකාරක ගීතයක් වනුයේ
    1) මහ බෝධි මුලේ 3) බැස සීතල ගඟුලේ
    2) කරුණා මුදේ නාමු ගිලීලා 4) ශ්‍රී මුනිදා නමදිමු දැන්
25. නාද උත්පාදකයන් වෙන් වෙන්වශයෙන් හඳුනාගත හැකි වීම හඳුන්වන්නේ
    1) ධ්වනි ගුණය 3) විපුල තාවය
    2) තාරතාවය 4) නාද තරංග
26. ගීතයක හඳුන්වාදීමේ වාදනයට අයත් කොටස හඳුන්වනු ලබන්නේ
    1) Inter lood යනුවෙනි. 3) Adlip යනුවෙනි.
    2) Introduction යනුවෙනි. 4) Bit යනුවෙනි
27. රොමැන්ටික්වාදී නිර්මාණ බිහිකරන ලද්දේ
    1) රවීන්ද්‍රනාත් තාගෝර් තුමා. 3) අමීර් කුශ්රූ පඬිතුමා.
    2) භාත්කණ්ඩේ පඬිතුමා. 4) බිතෝවන් සංගීතඥයා.

අංක 28 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා පහත දැක්වෙන වගුව භාවිතා කරමින් පිළිතුරු සපයන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | පැල් ගී | | මේවර කෙළිය | |
| 2 | | දෙවොල් මඩු | | |
| 3 | | | | ප්‍රශස්ති |

28. ඉහත A, B, C, D තීරු වල සඳහන් කරුණු වන ඒවා පිළිවෙලින් නම් කල යුත්තේ
    1) A ජීවන වෘත්තීන් මත ගොඩනැගුණු ගී, B සමාජයීය ගී, C ඇදහිලි හා විශ්වාස මත ගැයු ගී, D සේ ගී
    2) A සේ ගී, B ඇදහිලි හා විශ්වාස මත ගැයු ගී, C සමාජයීය ගී, D ජීවන වෘත්තීන් මත ගොඩනැගුණු ගී
    3) A සමාජයීය ගී, B ජීවන වෘත්තීන් මත ගොඩනැගුණු ගී, C සේ ගී, D සේ ගී
    4) A ජීවන වෘත්තීන් මත ගොඩනැගුණු ගී, B ඇදහිලි හා විශ්වාස මත ගැයු ගී, C සමාජයීය ගී, D සේ ගී


www.eduLanka.LK

29. අනාඝාතාත්මක ගී ඇතුලත් තීරුව වන්නේ
   1) C ය. 2) D ය. 3) A ය. 4) B ය.

30. වන්නම් හා තුන්සරණේ ගී ඇතුලත් කල යුතු තීරු 2 පිළිවෙලින් දක්වා ඇත්තේ
   1) A, B 2) B, D 3) C, D 4) B, A

31. දේශීය චිත්‍රපට කලාවේ හා චිත්‍රපට සංගීත ක්ෂේත්‍රයේ සන්ධිස්ථානයක් වශයෙන් සැලකිය හැකි චිත්‍රපටය වන්නේ
   1) රේඛාව 2) සැඩ සුළං 3) අල්ලපු ගෙදර 4) රන් මුතු දුව

32. කාෆි රාගයේ ශුද්ධ නිෂාධය
   1) වාදී ස්වරයක් ලෙස යෙදේ
   2) සංවාදී ස්වරයක් ලෙස යෙදේ
   3) විවාදී ස්වරයක් ලෙස යෙදේ
   4) වර්ජන ස්වරයක් ලෙස යෙදේ

33. $B^b$ මෙය බටහිර සංගීතයේ ස්වරයකි. මෙය පෙරදිග සංගීතයේදී හඳුන්වනුයේ
   1) ධ නමිනි. 2) ම ' නමිනි. 3) නි නමිනි. 4) ග නමිනි.

34. තබ්ලාව නිර්මාණය කලේ කුමන භාණ්ඩයක් ඇසුරු කරගෙනද?
   1) ඩෝල්කිය 2) මද්දලය 3) පක්වාජ් 4) මද්දලය

35. තුම්බාව සහිත කොටසක් ඇති සංගීත භාණ්ඩයකි.
   1) සිතාරය - වයලීනය
   2) එස්රාජය - සිතාරය
   3) ගිටාරය - සිතාරය
   4) වයලීනය - ගිටාරය

36. "මොහොමඩ් ගවුස්" මහතා
   1) දක්ෂ බටනලා වාදකයෙකි.
   2) සංගීත අධ්‍යක්ෂකවරයෙකි.
   3) ගායකයෙකි.
   4) චිත්‍ර ශිල්පියෙකි.

37. සංගීත සංරක්ෂණයේදී වර්තමානයේ භාවිතා කරනු ලබන උපකරණයක් නොවන්නේ
   1) ග්‍රැමෆෝන් තැටි
   2) CD
   3) DVD
   4) VCD

38. "මෝසාර්ට්" බටහිර සංගීතඥයා විසින් නිර්මාණය කරන ලද විශිෂ්ඨ සංගීත සංධ්වනිය (Symphony) වශයෙන් දැක්විය හැක්කේ
   1) කෝරල් number 9
   2) $E^b$ major number
   3) පැස්ටොරල් Number 6
   4) ජුපිටර් Number 4

39. මට / මෑ S ණී ව / ගේ S මට / පියා S ව / ගේ S මට මෙම ගීතය ආරම්භ වන්නේ
   1) සමග්‍රහයෙනි.
   2) අවග්‍රහයෙනි.
   3) විශම ග්‍රහයෙනි.
   4) ආඝාතයෙනි.

40. ආනන්ද සමරකෝන් ශූරීන් විසින් ගයන ලද ගීත ඇසුරින් ජනප්‍රිය ගීතයකි.
   1) පුදමු මේ කුසුම්
   2) දුල් සල්වනේ ලකල්
   3) අඹ දඹ නාරං
   4) වරෙන් හීන්සැරේ රිදී වලාවේ

www.eduLanka.LK



ඉස්කෝලේ
edulanka.lk

අවසාන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය
සංගීතය 11

1. කෙටි පිළිතුරු සපයන්න.

- පහත දක්වා ඇති ගීත ස්වර ප්‍රස්ථාරය උපයෝගී කරගෙන (I) සිට (III) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ස රි ග ම | ප _ ප ප | ම ප නි ධ | ප _ ප ප |
| සැ ප රි සි | දී S නෙ ක | අ ද රි න | මා S වැ ඩු |
| ම ප ම ග | රි _ රි රි | රි ම ග රි | ස _ _ _ |
| සො ඳු රැ දෙ | මා S පි ය | ප ද ව දි | මි S S S |

I. මෙම ගීතය අයත් රාගය කුමක්ද?
II. එම රාගයේ වාදී ස්වරය ලියන්න.
III. මෙම ගීතය ගායනා කළයුතු තාලය නම් කරන්න.

- අංක (IV) සිට (VI) තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශයන් වැරදිය. එම ප්‍රකාශ නිවැරදි කර ලියන්න.

IV. යමන් රාගයේ විකෘති ස්වරය වන්නේ ධ ස්වරයයි.
V. පාරු ගී, පතල් ගී ආඛ්‍යාත්මක ගී විශේෂයකි.
VI. නුර්ති රංග සම්ප්‍රදායේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය මද්දලයයි.

- අංක (VII) සිට (IX) තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවා නැවත ලියන්න.

VII. මාත්‍රා 2, 3 වශයෙන් විභාගවන හින්දුස්ථානි තාලය ……………………… තාලය වන අතර මාත්‍රා 3, 4 වශයෙන් විභාගවන තාලය ……………………… වේ.
VIII. ත්‍රිතාල් තාලයේ මාත්‍රා සංඛ්‍යාව ……………………… ක් වන අතර දාදරා තාලයේ දෙගුණයෙන් ලැබෙන මාත්‍රා සංඛ්‍යාව ……………………… ක් වේ.
IX. දුලා නෙතු පුලා……………………… නාට්‍යයේ ගීතයක් වන අතර, සත්සියක් සපුමල් ……………………… නාට්‍යයේ ගීතයක් වේ.

(ල. 12)

2.

I. පහත දැක්වෙන රාග විස්තර වලට අදාළ රාග නම් කරන්න.
(අ) ආරෝහණයේ රිෂභය හා ධෛවතය වර්ජිත වන අතර ගාන්ධාරය, නිෂාධය විකෘති වේ.
(ආ) සප්තකය අයත් සියලුම ප්‍රකෘති ව යෙදෙන අතර ධෛවතය, ගාන්ධාරය වාදී සංවාදී වේ.
II. ඉහත නම් කළ රාග දෙකේ ආරෝහණ, අවරෝහණ පිළිවෙලින් ලියා අදාල රාගයේ නම ලියන්න.
III. ඉහත රාග දෙකෙන් එකකට අයත් මධ්‍යලය ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.
IV. ඔබ ලියූ මධ්‍යලය ගීතයේ හින්දුස්ථානි තාලය නම් කරන්න.

(ල. 12)



ඉස්කෝලේ
edulanka.lk

3. පහත සඳහන් තාල වාද්‍ය භාණ්ඩ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B

I. ඉහත A සහ B වල සඳහන් භාණ්ඩ දෙක නම් කරන්න.
II. එයින් වැයෙන තාලයක් වෙන වෙනම ප්‍රස්ථාර කරන්න.
III. එම භාණ්ඩ දෙක අයත් සංගීත පද්ධතීන් සඳහන් කරන්න.
IV. නූර්ති හෝ නාඩගම් යන එක් සම්ප්‍රදායක් තෝරා එහි සංගීත ලක්ෂණ පැහැදිලි කරන්න.

(ල. 12)

4. පහත දැක්වෙන වගුවට බටහිර සංගීතය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

I.

| | නම | සංකේතය | සංකේතයේ මුල් වටිනාකම | තිතට එකතුවන වටිනාකම | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| (අ) | ඩොටඩ් සෙමිබ්‍රිව් | _ _ _ _ _ _ _ | 4 | _ _ _ _ _ _ _ | 6 |
| (ආ) | | ∂o | 2 | 1 | 3 |
| (ඇ) | ඩොටඩ් ක්‍රොචට් | _ _ _ _ _ _ _ | _ _ _ _ _ _ _ | 1/2 | 1 1/2 |

II. පහත සඳහන් බටහිර සංගීතයට අයත් පාරිභාෂික වචන පිළිබඳ හඳුන්වන්න.
(අ) Flat Mark
(ආ) Tie
(ඇ) Time Signature

III. B Flat ($B^b$) මේජර් ස්කේල් එකට අයත් ස්වර ලියා දක්වන්න. එය ප්‍රස්ථාරයක ලකුණුකර පෙන්වන්න.

IV. මේවා හඳුන්වන්න.
(අ) සෙමිබ්‍රිව් රෙස්ට්
(ආ) මිනිම් රෙස්ට්

(ල. 12)

5. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය සම්බන්ධයෙන් සුවිශේෂී චිත්‍රපට කීපයකි. ඒ ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) රේඛාව
b) මාතලන්
c) නිධානය
d) සත් සමුදුර
e) සන්දේශය
f) දුලීකා

I. රේඛාව චිත්‍රපටය හා එහි සංගීතය පිළිබඳව සඳහන් කළ හැකි විශේෂ කරුණු 3 ක් ලියන්න.
II. (b) අක්ෂරයෙන් දක්වා ඇති චිත්‍රපටයේ
❖ සංගීත අධ්‍යක්ෂකවරයා කවුද?
❖ ගායක ගායිකාවන් දෙදෙනෙක් නම් කරන්න.

www.eduLanka.Lk

- ජනප්‍රිය වූ ගීත දෙකක් සඳහන් කරන්න.

III. ඉහත තේමා ගීතයකින් හා තේමා සංගීතයකින් සමන්විත වූ චිත්‍රපටයට අදාලව පහත සඳහන් ඒවා නම් කරන්න.

- චිත්‍රපටයේ නම
- තේමා ගීතය ගැයූ ගායකයා
- සංගීත අධ්‍යක්ෂකවරයා
- තේමා ගීත රචකයා

IV. රේඛාව චිත්‍රපටයේ ගීත රචනා හා තනු නිර්මාණය කළ දෙදෙනා කවුද?

(ල. 12)

6.

I. ජන ගී වර්ගීකරණය අනුව පහත දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(අ) මූලික ප්‍රභේද දෙකන මි කරන්න.
(ආ) ගැමි ගී බිහිවීමට හේතු සාදක වූ ප්‍රධාන කරුණු තුන නම් කරන්න.
(ඇ) එම කරුණු මත බිහි වූ ගැමි ගී වර්ග නම් කරන්න.

II. ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගැමි ගී හඳුන්වා එම වර්ග දෙකට අයත් ගීත එක බැගින් නම් කරන්න.

(ල. 12)

7.

I. "ආලවෙලා පියසේ පටන් මම
කෝළ නැගිච සබයේ මේ දැන්"
(අ) ඉහත ගී පාද දෙකෙන් කියැවෙන ගී වර්ගය කුමක්ද?
(ආ) මෙහි විශේෂතා තුනක් ලියන්න.
(ඇ) ඉහත සඳහන් කළ ගී වර්ගයට අයත් ගීතයක කොටසක් පද ප්‍රස්ථාර කරන්න.

II. _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
නැටුම් නටන්නේ තාලෙට රාග කියන්නේ
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
කැඩපත ගන්නේ සුරතින් මූණ බලන්නේ

(අ) මෙහි හිස්තැන්වලට අයත් ගී පාද ලියා දක්වන්න.
(ආ) මෙම ගී වර්ගය අයත් රංග සම්ප්‍රදාය නම් කරන්න.
(ඇ) මෙහි විශේෂතා තුනක් සඳහන් කරන්න.

(ල. 12)



ඉස්කෝලේ edulanka.lk